**පැළෑණ සිරි වජිරඤාණ දහම් පාසල - වැලිගම**

ශ්‍රී බු. ව. 2566 - පළමුවාර පරීක්ෂණය - 2022 අගෝස්තු

04 - ශ්‍රේණිය

**කාලය පැය 01 යි විනාඩි 30 යි.**

**විභාග අංකය:-**.......................................................

## I කොටස

**(එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු (02) බැගින් මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු (30) කි)**

(01) සිදුහත් කුමරුගේ සුළු මව කවුරුන් ද?

i. මහාමායා දේවිය ii. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය iii. විශාකා සිටු දේවිය

(02) සිදුහත් මව කළුරිය කළේ කුමරා ඉපදී දින කීයකට පසුව ද?

i. දින 09 ii. දින 06 iii. දින 07

(03) සිදුහත් කුමරු ඉපදුනේ කුමන පොහොය දිනක ද?

i. වෙසක් පොහොය ii. ඇසළ පොහොය iii. පොසොන් පොහොය

(04) ගුත්තිල කාව්‍ය රචනා කළේ කවුරුන් විසින් ද?

i. රාහුල හිමි ii.ත්තැවේ හිමි iii. එස්. මහින්ද හිමි

(05) සුද්ධෝදන රජතුමාගේ අග මෙහෙසිය කවුරුන් ද?

i. යශෝදරා දේවිය ii. මහාමායා දේවිය iii. සුජාතා දේවිය

(06) සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා කවුරුන් ද?

i. සර්වමිත්‍ර බමුණා ii. කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා

iii. අසිත හෙවත් කාලදේව

(07) සිදුහත් කුමරු ඉපදුනේ කොහිදී ද?

i. කිඹුල්වත්පුරය ii. ලුම්බිණි සල් උයන iii. දෙව්දහ නුවර

(08) සිදුහත් කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව පැවසුවේ කවුරුන් ද?

i. කොණ්ඩඤ්ඤ බමුණා ii. සර්වමිත්‍ර බමුණා iii. යසකුල පුත්‍රයා

(09) මහාමායා දේවියගේ නැගණිය කවුරුන් ද?

i. යශෝදරා දේවිය ii. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය

iii. අනුලා දේවිය

(10) සිදුහත් කුමරුන්ගේ විවාහ මංගල්‍ය සිදුවන විට ඔහු පසු වූයේ කිනම් වයසක ද?

i. අවුරුදු (18) දී. ii. අවුරුදු (22) දී. iii. අවුරුදු (20) දී.

(11) සිදුහත් කුමරු විවාහ වූයේ කවුරුන් සමඟ ද?

i. යශෝදරා දේවිය ii. විහාර මහා දේවිය iii. උත්පලවණ්ණා කුමරිය

(12) සිදුහත් කුමරුගේ පුත්‍රයා කවුරුන් ද?

i. නන්ද කුමරු ii. දේවදත්ත කුමරු iii. රාහුල කුමරු

(13) "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව සම්පූර්ණයෙන් ඇසීමෙන් සෝවාන් වූයේ කවුරුන් ද?

i. උපතිස්ස පිරිවැජියා ii. කෝලිත පිරිවැජියා iii. සර්වමිත්‍ර පිරිවැජියා

(14) මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ පුතණුවන් කවුරුන් ද?

i. සිදුහත් කුමරු ii. නන්ද කුමරු iii. රාහුල කුමරු

(15) බුද්ධ මාතාව යන ගරු නාමයෙන් සම්මාන ලැබුවේ කවුරුන් ද?

i. මහාමායා දේවිය ii. ප්‍රජාපතී ගෝතමී දේවිය ii. යශෝදරා දේවිය

## II කොටස

**(එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව (70) කි.)**

(01) සතර පෙර නිමිති නම් කරන්න.

(02) i. සිදුහත් කුමරු උගත් ශිල්ප ශාස්ත්‍ර 02 ක් නම් කරන්න.

ii.සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ කිනම් අශ්වයා සමඟ ද?

(03) i. මහාමායා දේවිය දුටු සිහිනය කෙටියෙන් විස්තර කරන්න.

ii.මහාමායා දේවිය සිහිනය දුටුවේ කුමන පොහොය දවසක ද?

(04) i. මෛත්‍රී භාවනාව වැඩීමේ දී ගැහැණු ළමුන් වාඩි වන්නේ කෙසේ ද?

ii.මෛත්‍රී භාවනාව වැඩීමේ දී පිරිමි ළමුන් වාඩි වන්නේ කෙසේ ද?

(05) සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

(06) i. සොරුන් කණ්ඩායම ළඟට වැටුණු ගිරවාගේ නම කුමක් ද?

ii.මිහිරි වචනයෙන් කථා කරන ගිරවාගේ නම කුමක් ද?

iii.මෙම ජාතක කතාවේ නම කුමක් ද?

(07) උපතිස්ස කෝලිත දෙදෙනාගේ පැවිදි නම කුමක් ද?

i. උපතිස්ස -...............................

ii.කෝලිත -...............................